# පිටසක්වල මිතුරියගේ ඇරයුම



නෙත්‍යා දම්සාරි සමරකෝන්

ශාන්ත ජෝශප් මහා විද්‍යාලය (ගම්පොළ)

# කතෘගේ වෙනත් කෘති.

# පිටසක්වල මිතුරිය

නෙත්යා දම්සාරි සමරකෝන්

ISBN = 978-624-206-575-5

bar code - 9 786242 065755

පළමු පළ කිරීම 2023 - නොවැම්බර්

නෙත්යා දම්සාරි සමරකෝන්

අංක 14/1 ගම්පොළවත්ත

ගම්පොළ

දුරකථන අංකය - 076 1791655

# පිටසක්වල මිතුරියගෙ ඇරයුම

නෙත්යා දම්සාරි සමරකෝන්
ISBN = 978-624-208-753-5
දෙවන පළ කිරීම = 2025.02.08

නෙත්යා දම්සාරි සමරකෝන්
අංක 14/1 ගම්පොළවත්ත,
ගම්පොළ
දුරකථන අංකය = 076 1791655

III

# පිදුම

විද්‍යුත් පොතක් සම්පාදනය
සඳහා මා හට මඟ පෙන් වූ
මහනුවර මහමායා බාලිකා
විදුහලේ ගුරු විදුහල් පති
තුමියටත් නිබඳව ම මා දිරි ගැන්
වූ සෙනෙවිරත්න මහා ලේකම්
ගේ ගුරු පියානණ්ටත්, තනූජා
රත්නායක ගුරු මෑණියන් ටත්
ඉගෙනුම ලබන ගම්පොළ
ශාන්ත ජෝශප් විදුහලේ ගුරු
විදුහල්පතිතුමිය ඇතුළු මාගේ
ආදරණීය ගුරු මව්වරුන්ටත්
පියවරුන්ටත් මාගේ
සෙවණෑල්ල සේ මා පසු පස
සිටින ආදරණීය මවටත්
පියානණ්ටත් සෙනෙහසින්
පිළිගන්වමි!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණ ගත්කරණී** "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එදා මොරසූරණ වර්ෂාවක් ඇද හැලුණ අන්දකාර රැයක්. මා පාඩම් මේසයේ පාසල් වැඩ කරමින් සිටින අතර තුර වරින් වර විදුලි එලි මා දෙසට යොමු උනේ මා ඉතා බියට පත් කෙරෙන අන්දමිනි.



අකුණු හඬ නො ඇසීම එළිය මා දෙසටම යොමු වන නිසා බියෙන් උවත් මා ජනෙල් කවුළුවෙන් විපරම් කරේ ඒ කුමක් ද කියා දැන ගැනීමේ අරමුණින්.



මා දුටුවේ අද්භූත සිදු වීමක්. එනම් මිදුලේ කෙලවර නවතා මා දෙසට එලියන් විහිදුවන  කුඩා යානාවක්. බියක් දැනුනත් හිතට දැනුන කුතුහලය නිසාම මාගේ කුඩා මල් වැටුන රතු කුඩය ඉසලාගෙන හිමින් හිමින් ඒ දෙසට පිය නැගුවා.




මා යානය අසලට ලංවන විටම
ලස්සන එළි විහිදුවමින් එම යානය
වේගයෙන් ඉහළ අහසට ඇදී ගියා.
එහෙත් එම යානාව තිබුණ තැන
කුඩා සුදු පැහැති පෙට්ටියක් වැනි
යමක් වැටි ඇති බව මා දුටුවා.





හනිකට එය අහුලාගත් මා ඉක්මනින් කාමරයට පැමිණ දොර වසා ගත්තා. දැනුන කුතුහලය නිසා සෙමෙන් එය විවර කර බලද්දී කුඩා ලිපියක් එය තුළ තිබුණා. ලිපිය දිග හැර බලද්දී මට නෙත් අදහා ගත නොහැකි උනා. එම ලිපිය මා වෙත එවා තිබුනේ මීට කලකට ඉහතදී මට හමුඋන පිටසක්වල මිතුරිය ජෙනී.



පුදුමයකි. ඇය ලස්සනට සිංහල
අකුරු ගලපා තිබුණා. ඇය මා සමඟ
සිටි ටික කාලයේ මගෙන් උගත් දේ
හොඳින් මතක තබාගෙන තිබුණා.
එම ලිපියේ සඳහන්ව තිබුණේ
නොබෝ දිනකින් ඇගේ ලෝකය
පෙන්වීමට මා රැගෙන යා මට එන
බවත් ඒ සඳහා සූදානම්ව සිටින
ලෙසත්.


බලාපොරොත්තු දල්වාගෙන මා
බලා සිටියදී දින සති ඉක්මනින්
ගෙවී ගියා.ජෙනී මා සොයා ආවේ
නෑ.
එදා සිකුරාදා දවසක්, දින දෙකක්
පාසල් නිවාඩු ලැබි ඇති නමුත්
සඳුදා වාර විභාගය පැවැත්වෙන
බැවින් මා ඉතා උනන්දුවෙන් පාඩම්
වැඩ කළ යුතු කාලය එළඹ
තිබුණා.

තරමක් රෑ බෝ වන තුරු මා පාඩම් වැඩවල නිරතව සිටින අතර එදා මෙන් අමුතු එළියක් මා දෙසට යොමුවන බව දැනුනා. ජෙනී පැමිණ ඇතැයි සිතමින් මා ඉතා ඉක්මනින් අතට හසුවුණ ඇඳුමක් මල්ලේ දමාගෙන යානාව දෙසට දිව ගියා.



පුදුමයක්! මා මිතුරිය ජෙනී සිනා පිරි මුහුණින් මා දෙසට පැමිණියා.මොහොතක් අපි දෙදෙනා වැලඳගෙන සතුට එළ කරා. මා ඉක්මනින් නැවත මගේ ලෝකයට පැමිණිය යුතු නිසාත් ඇයගේ ලෝකය දැකීමේ කුතුහලය නිසාත් අපි ඉක්මනින් යානයට ගොඩ වුණා.



ඊයක වේගයෙන් යානය ඉහළ අහසට ඇදි යන අයුරු පමණක් මට තේරුම් ගියා. මගේ ගත සැහැල්ලු වී පාවී යන අයුරක් මට දැනුණා. යානය වේගයෙන් ඉහළ අහසට ඇදි යන නිසාම මොහොතකින් මට නින්ද ගොස් තිබුණා. ජේනී මට ඇහැරවන විට අපි ඇයගේ ලෝකයට පැමිණ ඇති බව වැටහුණා.



ඉක්මනින් ඇඳුම් මාරු කරගෙන ඉන් පසු යානාවෙන් පිටතට යමු කියා මා ජෙනීට පැවසුවා. ජෙනී මහ හඬින් සිනා සුනා. ඇයගේ ලෝකයේ ඇඳුම් නැති බවත් ඔවුන් අමුතු ජීවීන් කාණ්ඩයක් බවත් ඔවුන්ගේ හැසිරීම් බොහෝ  වෙනස් බවත් පැවසුවා.






මනුස්ස ජීවයක් උන මගේ තත්ත්වයේ අයගේ ලෝකයට ගමන් කල නොහැකි බවත් ඇය විසින් සපයා දුන් විශේෂිත ඇඳුම් කට්ටලය මා ඇඳගත යුතු බවත් පවසා සිටියා. ඇයගේ උපදෙස් පරිදි සැරසුන මම ඇය සමඟ යානයෙන් එළියට පැමිණියා.

බැලූ බැලූ අත කිසිඳු ගහක් කොලක් නොපෙනෙන දූවිල්ලෙන් පිරුණු කාන්තාරයක ස්වරූපයක් ගත් ඒ භූමියේ ජෙනී කෙසේ ජීවත් වෙනවාදැයි මට සිතුණා. ජෙනීගේ අමුතු පෙනුමක්,අමුතු හැසිරීම් රටාවක් මේ පරිසරය නිසා ලැබුණ දෙයක් ලෙස මට වැටහුණා. ඔවුන්ට ඉන්න ගෙවල් තිබුණේ නෑ. කුඩා පීරිසි වගේ යානා විශේෂයක ඔවුන් ජීවත් වුණා. ඒවා තැනින් තැනට ගමන් කරන යානා උණා.



ජෙනීගේ ලෝකය මගේ ලෝකය තරම් සැප පහසු ලස්සන තැනක් නොවන බවත් මට එහි ගත කිරීම ඉතා අපහසු බවත් , ඉක්මනින් නැවත මා මගේ ලෝකයට ඇරලවන ලෙසත් මම ඇයගෙන් ඉල්ලා සිටියා.





ඉන් පසු ජෙනී මට මේ
ලෝකයේ ජීවත් වීමට අපහසු
බව දන්නා බවත් පොරොන්දු
වුණ නිසා මට ඇගේ ලෝකය
පෙන්වීම ට රැගෙන ආ බවත්
පවසා සිටියා. ඇයගේ
ලෝකයේ ජීවත් වන අයට
අමුතු බලයක් ඇති බවත් , ඒ
බලය මට ලබා දියහැකි බවත් ,
ඒ මඟින් මට බොහෝ දේවල්
දිනාගත හැකි බවත් පවසා
සිටියා. ඇයගේ බලය මට ලබා
දෙන ලෙසත් ඉන් පසු අප
දෙදෙනා ට ලෝක දෙකක සිට
සම්බන්ධතා පවත්වමින්
අපගේ අදහස් බෙදාහදා ගත
හැකි බවත් පවසමින් මම
නැවතත් යානයට ගොඩ වුණේ
හැකි ඉක්මනින් මගේ ගෙදර
පැමිණීමේ අරමුණින්...

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි  මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය  මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණීය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන



ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්